## බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## මධ්‍යම සංස්කෘතික අරමුදල

# පුරප්පාඩු දැන්වීමයි

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති මධ්‍යම සංස්කෘතික අරමුදලේ පුරප්පාඩු වී ඇති පහත තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් වෘත්තිකයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ (සංවර්ධන) (පුරප්පාඩු සංඛ්‍යාව 01)

| | |
|---|---|
| වැටුප් පරිමාණය | HM 1-1 (රු.80,295 - 15X2,270 - 114,345/-) (ක.සේ.චක්‍රලේඛ අංක 2/2016) |
| වයස් සීමාව | වයස අවුරුදු 30 ට නොඅඩු හා අවු. 50 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පුරාවිද්‍යාව හෝ වාස්තුවිද්‍යාව පිළිබඳව ප්‍රථම උපාධියක් සමඟ පුරාවිද්‍යාව හෝ වාස්තුවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**සහ**

රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සැළසුම් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, ඇගයීම සහ ප්‍රගති පාලනය පිළිබඳ කාර්යයන්වලට අදාළ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද සමඟ ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම (මෙම වසර 15 න් අවම වශයෙන් වසර 05 ක් පශ්චාත් උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව විය යුතුය.)

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**පත්වීමේ ස්වභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා හිමිකම් සහිත සහකාර අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත් සංවර්ධන) (පුරප්පාඩු සංඛ්‍යාව 01)

| | |
|---|---|
| වැටුප් පරිමාණය | MM 1-2 (රු.54,550 - 10X1,375 - 15X1,910 - 96,950/-) (ක.සේ.චක්‍රලේඛ අංක 2/2016) |
| වයස් සීමාව | වයස අවුරුදු 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අයවිය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර පරිපාලන/ රාජ්‍ය පරිපාලන උපාධිය හෝ පිරිස් පාලනය, කළමනාකරණය යන විෂයයන් ඇතුළත්ව ලබාගත් උපාධියක් ලබා තිබීම සමඟ රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

විවෘත තරඟ විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**පත්වීමේ ස්වභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා හිමිකම් සහිත

## අභ්‍යන්තර විගණක (පුරප්පාඩු සංඛ්‍යාව 01)

| | |
|---|---|
| වැටුප් පරිමාණය | MM 1-2 (රු.54,550 - 10X1,375 - 15X1,910 - 96,950/-) (ක.සේ.චක්‍රලේඛ අංක 2/2016) |
| වයස් සීමාව | වයස අවුරුදු 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ/ වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ හෝ සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම.

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය සහ විගණනය විෂයයන් සහිතව ලබාගත් උපාධියක් හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ/ වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ හෝ සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ මධ්‍යම පරීක්ෂණ සහතිකය හෝ ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණ උසස් ඩිප්ලෝමා සහතිකය සමඟ රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විගණන කටයුතු පිළිබඳව වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

විවෘත තරඟ විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**පත්වීමේ ස්වභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා හිමිකම් සහිත

## ගිණුම් නිලධාරී (පුරප්පාඩු සංඛ්‍යාව 03)

| | |
|---|---|
| වැටුප් පරිමාණය | JM 1-1 (රු. 42,600-10 X 755 -18 X 1135 - 70,580/-) (ක.සේ.චක්‍රලේඛ අංක 2/2016) |
| වයස් සීමාව | වයස අවුරුදු 22 ට නොඅඩු හා අවු. 35 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණ විෂයයන් ඇතුළත්ව ලබාගත් උපාධියක්

**හෝ**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ හෝ සහතිකලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ මධ්‍යම පරීක්ෂණය සමත්වීම

**හෝ**

ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණ උසස් ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

**සමග**

රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගිණුම් කටයුතු පිළිබඳ වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

විවෘත තරඟ විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**පත්වීමේ ස්වභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා හිමිකම් සහිත

**පොදු සුදුසුකම්**

**සෑම අපේක්ෂකයෙක්ම,**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය

(ආ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**වෙනත්**

රජයේ, රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් සමඟ තනතුරට තෝරා ගතහොත් නිත්‍ය තනතුරින් නිදහස් කරන බවට තම ආයතන ප්‍රධානීන්ගේ එකඟතාව ඇතුළත් ලිපියක් ද සහිතව ඉදිරිපත් කළ යුතුය. (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.)

මේ සඳහා ඉදිරිපත් වීමට අභිලාෂය පළකරන අයදුම්කරුවන් www.ccf.gov.lk/notices වෙබ් අඩවිය මඟින් බාගත කරනු ලබන අයදුම්පත් සම්පූර්ණ කර තමාගේ සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පිටපත් ද සමඟ 2024.07.27 දිනට පෙර ලැබෙන ලෙසට **"අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදල, 212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල මඟින් පමණක් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර නිවැරදිව සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**මධ්‍යම සංස්කෘතික අරමුදල,**
**212/1, බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**